**ශීර්ෂය 282 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

**---------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

1.1 **තත්වාගණනය කල මතය**

**-----------------------------**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 01 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 3 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) මෙම වාර්තාවේ 1.6.2 සහ 1.6.3 ඡේදයන්හි ඇතුලත් නිරීක්ෂණ සම්බන්ධයෙන් පසුගිය වර්ෂයෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි අයිතම 398 ක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් යටතේ ඇතුළත් කර නොතිබුණි. | මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඇතුලත් කළ යුතුය. | එකඟ වෙමි. |

### 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) **මුදල් පොත** මුදල් රෙගුලාසි 446 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල **04** ක මුදල් පොත යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 446 හි සඳහන් විධිවිධාන ප්‍රකාරව මුදල් පොත යාවත්කාලීන කර ගත යුතුය. | එකඟ වෙමි. |
| (ආ) **තොග පොත** මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව මුතුකෙලියාව වාරිමාර්ග වැඩ බිමේ තොග පොත් යාවත් කාලීන කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව තොග පොත් යාවත් කාලීන කර ගත යුතුය. | එකඟ වෙමි. |

(ඇ) **චෙක්පත් භාරදීමේ ලේඛණය**

| | | |
|---|---|---|
| ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල 04 ක මුදල් රෙගුලාසි 139(5) ප්‍රකාර චෙක්පත් භාරදීමේ දී ආදායකයාගේ අනන්‍යතාවය තහවුරු වන පරිදි චෙක්පත් භාර දීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 139(5) ප්‍රකාර ආදායකයාගේ අනන්‍යතාවය තහවුරු වන පරිදි චෙක්පත් භාරදීමේ ලේඛණය පවත්වාගත යුතුය. | එකඟ වෙමි. |

(ඇ) **ඇප ලේඛනය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයින්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛනයක් පවත්වාගත යුතුය. | එකඟ වෙමි. |

## 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීතිරීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i). XIX වැනි පරිච්ඡේදයේ 6.13.1 සහ 7.1 වගන්තිය | රජයේ නිල නිවාස භාවිතා කරන ලද නිලධාරින් සේවයෙන් විශ්‍රාම ලැබීම, ස්ථාන මාරුවීම හෝ සේවය අතහැරයාමේ දී එම නිල නිවාස වෙන් කර දෙන බලධාරියා වෙත භාරදියයුතු වුව ද දෙපාර්තමේන්තුවේ නිල නිවාස 17 ක් සම්බන්ධයෙන් එපරිදි භාර දී නොතිබුණි. | නිලධාරින් විශ්‍රාම යාමට ප්‍රථම නිල නිවාස භාර ගත යුතුය. | එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| (ii). XXIV වන පරිච්ඡේදයේ 3:18:1 වගන්තිය | සමාලෝචිත වර්ෂය අවසාන වන විට වැටුප් රහිත නිවාඩු ලබාගත් නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂයේ වටිනාකම රු.1,741,987 ක් වී තිබුණි. ඉන් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට නිලධාරින් 06 දෙනෙකුගේ අයවීම් හිඟව තිබෙන ණය ශේෂය රු.167,066 ක් විය. ඒ අනුව ණය අයකරගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණු බවක් නිරීක්ෂණය විය. | ඇපකරුවන්ගෙන් හෝ වගකියුතු නිලධාරින්ගෙන් ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. |
| (iii) XXIV වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය | විශ්‍රාම ගිය නිලධාරින් 150 දෙනෙකුගෙන් 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය මුදල රු.13,306,578 ක් වූ අතර ඒ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. මේ අතරින් නිලධාරීන් 10 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 627,486 ක් වූ ණය මුදල වර්ෂ 05 කටත් වඩා පැරණි ණය ශේෂ විය. | ආයතන සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. |
| (iv) XXIV වන පරිච්ඡේදයේ 4.5 වගන්තිය | මියගිය නිලධාරින් 14 දෙනෙකුගෙන් රජයට අයවිය යුතු ණය ශේෂය රු.1,636,392 ක් වී තිබුණු අතර ඉන් වර්ෂ 02 ත් 03 ත් අතර කාලයට අදාල ණය ශේෂය රු 281,647 ක් වී තිබුණු අතර වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් වූ ණය ශේෂය රු.301,669 ක් විය. මේ අනුව රජයට අයවිය යුතු මුදල් ප්‍රධාන ණයකරුගෙන් අයකර ගත නොහැකි අවස්ථාවලදී ඒ සම්බන්ධව ආයතන සංග්‍රහය අනුව කටයුතු කර නොතිබුණු බවක් නිරීක්ෂණය විය. | ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.5 වගන්තිය අනුව කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) | මුදල් රෙගුලාසි 127 | ප්‍රධාන කාර්යාලය විසින් ප්‍රතිපාදන සලසා නොතිබියදී මොනරාගල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාල බල ප්‍රදේශයේ කාර්යයන් දෙකකට අදාළ සැපයුම්කරුවන් 05 දෙනෙකු වෙත රු.9,980,060 ක්වූ චෙක්පත් 05 ක් නිකුත් කර තිබුණි. | මුදල් රෙගුලාසි 127 ප්‍රකාරව කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. |
| | (ii) | මුදල් රෙගුලාසි 213 | බත්මැඩිල්ල වම් ඉවුරු ඇලේ රොන් මඩ ඉවත් කිරීමේ කර්මාන්තය සම්බන්ධයෙන් කම්කරුවන් යොදා ගැනීමේදී දෛනිකව වැටුප් ලබන කම්කරුවන් සම්බන්ධයෙන් චෙක් රෝල් තබා ගත යුතුවිය. තවද, පැමිණීම සටහන් කිරීමේ කාර්යය විශේෂයෙන් පවරනු ලැබූ නිලධාරීන් විසින් එම පරීක්ෂාවන් සිදු කර බැලිය යුතුද වේ. එහෙත් කන්දකැටිය ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලය ඉහත අවශ්‍යතාවය ඉටු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසිය 213 අනුව කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. |
| | (iii) | මුදල් රෙගුලාසි 260, 139 | බත්මැඩිල්ල වම් ඉවුරු ඇලේ රොන්මඩ ඉවත් කිරීමේ කර්මාන්තයේදී කම්කරුවන් හා මුරකරුවන් ලෙස යොදාගත් සේවකයින්ට වැටුප් ගෙවන අවස්ථාවේදී ආදායකයාගේ අනන්‍යතාවය තහවුරු කරගැනීමකින් තොරව මුදල් ගෙවා තිබුණි. | මුදල් රෙගුලාසිය 260 හා 139 අනුව කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුව විසින් ඉටුකිරීමට සැලැසුම් කරන ලද කාර්යයන් ඉටුකිරීම සඳහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කිරීමට සැලැසුම් කර තිබුණු මුළු අග්‍රිම අවශ්‍යතාවය රු.18,726,342,000 ක් වී තිබුණ ද භාණ්ඩාගාරය විසින් නිකුත් කර තිබුණු අග්‍රිමය රු.14,307,927,000 ක් වී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාරයෙන් නොලැබුණු අග්‍රිමය, ඉල්ලුම් කිරීමට සැලසුම් කරන ලද අග්‍රිමයෙන් සියයට 23.6 ක් වී තිබුණි. | සැලසුම් කළ පරිදි අග්‍රිම ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. |
| (ආ) | අංක 7002/0000/00/0040/0017/000 දරන ගිණුමට අදාළව රු.5,853,293 ක අග්‍රිම ශේෂයක් නිරවුල් වී නොතිබුණි. | අග්‍රිම ගිණුමේ නොපිය වූ ශේෂය නිරවුල් කළ යුතුය. | එකඟ වෙමි. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මෙහෙයුම් කල් බදු ක්‍රමය යටතේ මිල දී ගත් වාහන සඳහා කල් බදු වාරික ගෙවීමට වැඩසටහන 1 යටතේ වෙන් කරගෙන තිබුණු රු.28,000,000 ක් වූ මුළු ශුද්ධ වෙන් කිරීමෙන් රු.15,442,184 ක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයකට මාරු කර තිබුණු අතර රු.12,557,816 ක ශුද්ධ වෙන් කිරීම ද ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන වැය කිරීම හා අග්‍රිම ලබා ගැනීම සැලසුම් කළ පරිදි ඉටු කළ යුතුය. | එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඇස්තමේන්තු සකස්කිරීමේ දී අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව කටයුතු කිරීම සහ සැලසුම් කරන ලද පරිදි වැඩ කටයුතු සිදු නොකිරීම යන හේතු නිසා වැය විෂයයන් 09 ක් සඳහා වෙන් කර තිබුණු මුළු එකතුව රු.12,827,920,894 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.4,123,919,568 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිවීම් සියයට 16 සිට සියයට 35 ත් අතර පරාසයක් ගෙන තිබුණි. | සැළසුම් කළ පරිදි ප්‍රතිපාදන ලබා ගැනීම හා වැය කිරීම කළ යුතුය. | එකඟ වෙමි. |
| (ඇ) | ප්‍රතිපාදන අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගැනීමකින් තොරව වැය විෂයයන් අතර මුදල් මාරු කිරීම හේතුවෙන් මූලධන වැය විෂයයන් 02 ක් සඳහා එලෙස වෙනත් වැය විෂයයන්ගෙන් මාරු කර තිබුණු රු.86,059,000 ක මුදලක් සම්පූර්ණයෙන් ම ඉතිරි වී තිබුණි. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගෙන ප්‍රතිපාදන වෙන් කර ගත යුතුය. | එකඟ වෙමි. |
| (ඈ) | මූලධන වැය යටතේ ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තුවකින් ලබා ගෙන තිබුණු රු.300,000,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | ප්‍රතිපාදන ලබා ගැනීමට පෙර කාර්යයන් නිවැරදිව ඉටු කිරීමට සැලසුම් කළ යුතුය. | එකඟ වෙමි. |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ රු.10,000 ක් වූ වැරදි ''හර'' කිරීම් සහ රු.13,621 ක් වූ වැරදි ''බැර'' කිරීම් තිබුණි. | ගිණුම් තැබීම නිවැරදිව ඉටු කළ යුතුය. | එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 02 කට වැඩි කාලයක සිට පැවත එන මිය ගිය සේවකයන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු.583,316 ක් වූ ණය මුදල සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4.4 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ඉන් ණයකරුවන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු රු.301,697ක ණය මුදල වර්ෂ 05 කට වඩා පැරණි ඒවා විය. | ආයතන සංග්‍රහයේ **XXIV** වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 118 සහ 2004 ඔක්තෝබර් 11 දිනැති අයවැය චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. |

**2.4 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ නිලධාරින් 66 දෙනෙකු වෙත ලබා දී තිබුණු එකතුව රු.1,229,100 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම සඳහා අදාල අත්තිකාරම් ලබාගත් කාර්යය නිම වී මාසයකට වඩා වැඩි කාලයක් දක්වා ප්‍රමාද කර තිබුණි. | කාර්යය නිම වූ වහාම අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. |

**2.5 තැන්පත් ශේෂයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අංක 6000/0000/00/0016/0008/000 දරන පොදු තැන්පත් ගිණුමේ ඇති රු.4,156,503 ක තැන්පත් සඳහා වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් ගත වී තිබුණ ද මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 570 අනුව කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | යුධගනාව වැවේ ප්‍රධාන සොරොව්ව ඉදිකිරීමට රු.4,726,000 ක පිරිවැය මූලික ඇස්තමේන්තුවක් පිළියෙල කර අනුමත කරගෙන තිබුණද අමතර වැඩ කොටස්ද ඇතුලත් කරමින් රු.5,978,000 ක ඇස්තමේන්තුවක් පසුව අනුමත කර තිබුණි. පූර්ණ අධීක්ෂණයකින් හා සැලසුමකින් තොරව ඇස්තමේන්තු සකස්කිරීම හේතුවෙන් මුල් ඇස්තමේන්තු මුදලට වඩා සියයට 126.5 කින් ඇස්තමේන්තු මුදල වැඩි වී තිබුණි. | පූර්ණ අධීක්ෂණයකින් හා සැලසුම්සහගතව ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. | එකඟ වෙමි. |
| (ආ) | රාත්‍රී වැවේ ප්‍රතිසංස්කරණය සඳහා මුල් ඇස්තමේන්තුවේ ප්‍රධාන සොරොව්ව ඉදි කිරිමට රු.2,000,000 ක් වෙන්කර තිබුණි. පසුව එම වැඩ කොටස් හා සොරොව්වේ අමතර වැඩ කොටස් නිමකිරීම සඳහා සකස්කර තිබෙන ඇස්තමේන්තුව රු.16,906,000 ක් වූ අතර එය මුල් ප්‍රතිපාදනය ඉක්මවීම සියයට 845 වී තිබුණි. | නිවැරදිව සැලසුම් සකස් කළ යුතුය. | එකඟ වෙමි. |
| (ඇ) | රදාන වැව ඉදිකිරීම ආරම්භ කිරීමට ප්‍රථම ඊට අදාළ සැලසුම් සකස් කිරීමකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කර තිබීම හා වැඩ නිමකිරීමට කාල රාමුවක් තීරණය කිරීමකින් තොරව 2019 ජුනි 01 දින වැඩ ආරම්භ කර තිබුණි. මේ හේතුවෙන් වැව ප්‍රතිසංස්කරණය සිදු කර අවසන්කිරීමට ගතවන කාලය නිශ්චිත වී නොතිබුණි. | නිවැරදි ලෙස සැලසුම් සකස් කළ යුතුය. | එකඟ වෙමි. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) යුධගනාව වැවේ ප්‍රදේශවාසීන් විසින් ඉදිකරන ලද පාලමක් නිසා පිටවානෙන් ඉකුත්වන ජලය පහත් බිම් කරා ගලා යෑමට බාධා වී තිබුණි. එම පාලම ඉවත් කිරීම හෝ පිටවානෙන් ඉවත්වන ජලය අවහිරතාවයකින් තොරව ගලා යෑමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | නිවැරදිව සැලසුම් සකස් කළ යුතුය. | එකඟ වෙමි. |
| (ආ) කෙසෙල්ලන්ද වැවේ පිටවාන අළුත්වැඩියා කිරීම සඳහා 2017 වර්ෂයේදී රු.4,000,000 ක ඇස්තමේන්තුවක් පිළියෙලකර ප්‍රතිපාදන ලබාගෙන තිබුණ ද විගණන දිනය වූ 2019 සැප්තැම්බර් 19 දින දක්වාම ඉදිකිරීම කටයුතු ආරම්භ කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. |

## 3.3 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ ලබාගැනීමේදී ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට වාරිමාර්ග වැය විෂයයට ඇතුලත් නොවන බාහිර කාර්යයන් ද ඇතුලත්ව තිබුණි. ඒ අනුව කෘෂිකර්මාන්ත ව්‍යාප්ති සේවා පුහුණු හා ප්‍රදර්ශන වැඩසටහන් , වෙළඳ හා ගබඩා පහසුකම් සහ ග්‍රාමීය හා නාගරික යටිතල පහසුකම් සංවර්ධනය යන කාර්යයන් ද ඇතුලත් කර තිබුණි. | විෂය පථයට අදාළ නොවන කාර්යයන් අමාත්‍යමණ්ඩල සංදේශයට ඇතුලත් නොකළ යුතුය. | කෘෂි ඵලදායීතාවය නැන්වීම තුළින් දිස්ත්‍රික්කයේ ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය නැංවීම අරමුණු කරගෙන වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය සැලසුම් කර ඇත. වාරි/අමාසං/06/2015 යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව අදාළ සංරචකයන් උක්ත අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් ආවරණය වේ. |

## 3.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනවලින් රු. 196,878,000 ක් වූ ව්‍යාපෘති 6 ක් අවසන් කර නොතිබුණි. මේ හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිඵල ප්‍රදේශයේ ගොවි ජනතාවට ලැබීම ප්‍රමාද වී තිබුණි. | ව්‍යාපෘතිය සැලසුම් කිරීම හා ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම නිසි කළමනාකරණයකින් යුතුව ඉටු කළ යුතුය. | එකඟ වෙමි. |
| (ආ) | වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය යටතේ උනගොල්ල ගෙවල්වල ඇළ ඉදිකිරීම් සඳහා රු.11,336,978 ක මුදල් නිදහස් කර දීර්ඝ කාලයක් ගත වී තිබුණ ද 2019 ජුලි දක්වා වැඩ නිමකර නොතිබුණි. | මනා සැලසුමකින් හා අධීක්ෂණයක් යටතේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ යුතුය. | එකඟ වෙමි. |
| (ඇ) | කෙසෙල්ලන්ද වැව් බැම්ම සකස් කිරීම සඳහා ප්‍රමාණ බිල්පත්‍ර අයිතම අංක 1.6 යටතේ රු.2,082,888 ක මුදලක් වෙන්කර ගෙන තිබුණි. වැව් බැම්මේ ආනතිය 1:3 අනුපාතයට සකස් කිරීම හා ප්‍රමිතියට පස් තැලීම (Compaction) කළයුතු වුවද ප්‍රමිතියෙන් තොරව පස් තැලීම (Compaction) සිදුකර තිබුණු අතර අදාළ Compaction වාර්තාවද ලබාගෙන නොතිබුණි. | සැලසුම් කළ පරදි ව්‍යාපෘතියේ වැඩ ඉටු කළ යුතුය. | එකඟ වෙමි. |
| (ඈ) | කෙසෙල්ලන්ද වැව ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රමාණ පත්‍රයේ අයිතම අංක 1.8 යටතේ වැව් බැම්මේ ඉහළ බැවුම් රළපනාව ඉදිකිරීම සඳහා රු.4,871,650 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. විගණන දිනය වූ 2019 සැප්තැම්බර් 19 දින දක්වාම එම රළපනාව ඉදිකර නොතිබුණි. | සැලසුම් කළ පරිදි කාර්යයන් ඉටු කළ යුතුය. | එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කෙසෙල්ලන්ද වැව ප්‍රතිසංස්කරණයට අදාළ ප්‍රමාණ බිල්පත්‍ර අයිතම 1.10 යටතේ වැව් බැම්ම නියමිත 1:3 ආනතියට සකස්කර නිසි පරිදි තණපිඩලි ඇල්ලීම සඳහා රු.854,762 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද එම කාර්ය ප්‍රමිතියට සිදු නොකිරීම නිසා වැව් බැම්ම විශාල ලෙස බාධනයට ලක් වී තිබුණි. | සැලසුම් කළ පරිදි කාර්යයන් නිසි පරිදි ඉටු කළ යුතුය. | එකඟ වෙමි. |

## 3.5 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යුධගනාව වැව් බැම්ම රළපනාව ඉදිකිරීම හා වැව් පතුළ සකස් කිරීමේ කටයුතු නිම කිරීම ප්‍රමාද වීම නිසා ප්‍රදේශයේ ගොවි ජනතාව වගා කන්න 05 ක් වගා කිරීමට නොහැකි වී තිබුණි. | වැව් හා ජලාශවල සංවර්ධන කටයුතු කඩිනමින් අවසන් කළ යුතුය. | එකඟ වෙමි |

## 3.6 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේදී යුධගනාව වැවේ රළපනාව ඉදිකිරීමේ කටයුතු සඳහා රු.35,883,000 ක ඇස්තමේන්තුවක් යටතේ වැව් පතුල සකස් කිරීමේ කටයුතුද ඉටු කිරීම වෙනුවෙන් රු.33,372,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර 2019 සැප්තැම්බර් වන තෙක් එම කටයුතු අවසන් කර නොතිබුණි. | වැව් හා ජලාශවල ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් ඉටු කළ යුතුය. | එකඟ වෙමි |

## 3.7 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මොණරාගල කලාප වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය මගින් ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මි.මි. 12 ප්‍රමාණයේ දගර කම්බි මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවා තිබූ අතර සැපයුම්කරුවන් 05 දෙනෙකු මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. ලියාපදිංචි සැපයුම්කරුවන් කොපමණ ප්‍රමාණයකින් මිල ගණන් කැඳවූයේද යන්න විස්තර විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. මිල ගණන් ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම් කරනු ලැබූ ලිපියෙහිම මිල ගණන් සඳහන් කර එවා තිබූ අතර එම ලිපිය අදාළ ආයතනය වෙත යොමු කළ එකක් බව තහවුරු නොවීය. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය. | එකඟ වෙමි |

## 3.8 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව සතු වාහන 45 ක් බාහිර පාර්ශවයන්ට ලබා දී තිබුණු අතර බාහිර ආයතනවලින් ලබාගෙන තිබෙන වටිනාකම රු.37,700,000 ක් වූ වාහන 12 ක අයිතිය නිරවුල් කර නොතිබුණි. | බාහිර ආයතන වෙත ලබා දුන් වාහන සහ බාහිර ආයතන වෙතින් ලබාගත් වාහන එම ආයතන වෙත පවරා දීමට හෝ නැවත පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | එකඟ වෙමි |
| (ආ) 2019 වර්ෂය තුළ කිලෝමීටර 5000 ට අඩුවෙන් ධාවනය කළ මෝටර් රථ 21 ක් පැවති අතර එම මෝටර් රථ 21 හි තක්සේරු වටිනාකම රු.24,675,000 කි. | වත්කම් කාර්යක්ෂමව උපයෝජනය කළ යුතුය. | එකඟ වෙමි |

| | | | |
|---|---|---|---|
| (ඈ) | යුධගනාව වැඩ බිම භාර ඉංජිනේරු සහකාරවරයා විසින් පවත්වාගෙන ගිය ක්ෂේත්‍රයේ බඩු සටහන් පොතට අනුව රු.137,100 ක් වටිනා ඉතිරි දඟර කම්බි මෙ.ටොන් 01 ක ප්‍රමාණයක් ගබඩා භාරකරු වෙත භාර දී ඇති බව සඳහන් කර තිබුණි. එම තොගය ගබඩාව වෙත ලැබී ඇති බවට තොග පොතේ කිසිදු සටහනක් දක්වා නොතිබුණු අතර එම කම්බි තොගය ගබඩා භාරකරු විසින් භාරගත් බවට ලැබීම් තුන්ඩුවක් නිකුත්කර නොතිබුණි. | ගබඩා ඉන්වෙන්ට්‍රි පොත් / ලේඛන නිවැරදිව යාවත්කාලීනව පවත්වාගෙන යා යුතුය. | එකඟ වෙමි . රදාන වැඩබිම භාර ඉංජිනේරු සහකාර වෙත භාර දී ඇත. ඔහුගේ මාසික ද්‍රව්‍ය වාර්තාවල සටහන් වී ඇත. |
| (ඇ) | ගොඩනැගිලි **29** ක් සහිත මොනරාගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කදවුරු භූමිය සඳහා මිණුම් වාර්තා සහ මිණුම් කරන ලද පිඹුරුපත් විගණනයට ඉදිරිපත් නොවීය. ඒ අනුව කදවුරු භූමියේ ඉඩමේ ප්‍රමාණය කොපමණ ද යන්න හා මායිම් නිශ්චිතව හදුනාගත නොහැකි වූ අතර මේ නිසා භූමියේ ආරක්ෂාවට (භාහිර පුද්ගලයින් විසින් භූමිය අත්පත් කරගැනීම) තර්ජන එල්ලවී තිබුණි. | රජයේ ඉඩම් හා වත්කම් අරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. | එකඟ වෙමි |
| (ඉ) | මොණරාගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කදවුරු භූමිය තුළ බවුසර් 02 ක්, බවුසර් ටේලරයක්, කැරවෑන් රථයක්, බේබි ඩම්පයර් යන්ත්‍රයක් වර්ෂ 2 කට වැඩි කාලයක සිට භාවිතා කිරීමකින් තොරව අතහැර දමා තිබුණි. එම යන්ත්‍ර හා උපකරණ අළුත්වැඩියාකර භාවිතා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | භාවිතා කිරීමට නොහැකි යන්ත්‍ර හා උපකරණ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. | එකඟ වෙමි |

## 3.9 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මොනරාගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු කාර්යාල කදවුරු භූමියට ඇතුල්වන ගේට්ටුව අසල කදවුරු භූමියේ කොටසක් භාහිර පුද්ගලයින් විසින් අත්පත් කරගෙන තිබුණු අතර ඉඩම අත්පත් කරගත් පුද්ගලයින් සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග නොගෙන එම අත්පත් කරගත් ඉඩම් කොටස අතහැර දැල්වලින් ආවරණය වන වැටක් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ඉදිකර තිබුණි. | 1982 අංක 12 දරන පොදු දේපල විෂයෙහිලා සිදු කරනු ලබන වැරදි පිළිබඳ පනත අනුව කටයුතු කළ යුතුය. | එකඟ වෙමි |
| (ආ) හානි හා පාඩු ලේඛනය අනුව 1982 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා වූ කාලය තුළ රු.20,630,260 ක් වූ හානි හා පාඩු 39 ක් සිදු වී තිබුණි. එම හානි හා පාඩු සිදු වී දීර්ඝ කාලයක් ගත වී තිබුණ ද ඒවා නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 103 අනුව කටයුතු කළ යුතුය. | එකඟ වෙමි |

## 3.10 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 වර්ෂය සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද භෞතික හා මූල්‍ය කාර්යසාධන ප්‍රගති වාර්තාවේ තොරතුරු දෝෂ සහිතව ඉදිරිපත් කර තිබුණි. | භෞතික හා මූල්‍ය කාර්යසාධන ප්‍රගති වාර්තාව නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. | එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 අගෝස්තු 13 දිනට කෙසෙල්ලන්ද වැවේ අළුත්වැඩියාව ආරම්භකර ඇතත් යන්ත්‍ර සූත්‍ර හා වාහන යොදා ගනිමින් පස් වැඩ පමණක් සැලසුමකින් තොරව සිදුකිරීම නිසාත් වැව් ජලය රඳවා ගැනීමට අවශ්‍ය අනිකුත් කිසිදු කාර්යයක් සිදු නොකර තිබීම නිසාත් එම කාර්යයන් අත්හැර දමා ඇති බව නිරීක්ෂණය විය. | නිවැරදිව සැලසුම් සකස් කර එම සැලසුම්වලට අනුව වැඩ කළ යුතුය. | එකඟ වෙමි. |
| (ඇ) | ප්‍රදේශයේ ජනතාව භාවිතා කරමින් තිබුණු කෙසෙල්ලන්ද වැව අළුත්වැඩියා කර ජල ධාරිතාවය ඉහළ නැංවීම සඳහා වෙල්ලස්ස නවෝදය ව්‍යාපෘතිය යටතේ රු.43,715,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් 2017 දෙසැම්බර් 28 දින අනුමත කර තිබුණි. එම ඇස්තමේන්තුවට අනුව කෙසෙල්ලන්ද වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා එක් එක් අයිතම යටතේ ඇස්තමේන්තු සකස් කර තිබුණද එම අයිතම යටතේ දරන ලද වියදම පැහැදිළිව හඳුනාගත හැකි වන පරිදි වියදම් වාර්තා නඩත්තු කර නොතිබුණි. | ව්‍යාපෘති සඳහා වියදම් දැරීමේද හඳුනාගත හැකි වන පරිදි වියදම් වාර්තා තබා ගත යුතුය. | එකඟ වෙමි. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

**---------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | -------------------------- |
| (අ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව දිවයින පුරා පිහිටි මහා වාරි කලාප 11 ක (මහවැලි බල ප්‍රදේශය හැර) ආක්‍රමණශීලී ශාකවල ව්‍යාප්තිය සම්බන්ධයෙන් 2015 වර්ෂයේ සමීක්ෂණයක් සිදු කර ඇති අතර එහිදී ආක්‍රමණශීලී ශාක පවතින බව හඳුනාගෙන ඇත. ඒ අනුව සමස්ත වාරි පද්ධතියෙහි එනම් වැව්, අමුණු, ඇල මාර්ග හා වාරි රක්ෂිත තුළ ආක්‍රමණික ශාක ව්‍යාප්තිය සාමාන්‍යයෙන් සියයට 45 ක් වූ අතර එය එක් එක් වාරිකලාපය තුළ ව්‍යාප්තිය සියයට 27 සිට සියයට 66 දක්වා | 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත අනුව කටයුතු කළ යුතුය. | එකඟ වෙමි. |

| | | | |
|---|---|---|---|
| | පරාසයක ව්‍යාප්ත වී පැවති බව වාර්තා වී තිබුණි. මේ හේතුවෙන් වාර්ෂික නඩත්තු වියදම් ඉහළ යාම, ඇල මාර්ග ගොඩවීම හා ජල ධාරිතාවය අඩු වීම, වාෂ්පීකරණය උත්ස්වේදනය මගින් සිදු වීම හා ජලයේ ගුණත්වයට බලපෑම් සිදුවීම, ජල දූෂණය යනාදී ගැටලු රාශියකට මුහුණ දී ඇති බවක් නිරීක්ෂණය විය. | | |
| (ආ) | 1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනතේ 1 වන කොටසේ 3 වන වගන්තිය ප්‍රකාරව පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හා බලාත්මක කිරීමේ කාර්යයන් සඳහා තමාට සහය වීම පිණිස වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් නිලධාරින් 24 දෙනෙකු "බලයලත් නිලධාරීන්" වශයෙන් 2017 මාර්තු 30 දින පත් කර තිබුණි. 2015 වර්ෂයෙන් පසුව වාරි පද්ධතිය තුළ ආක්‍රමණශීලී ශාකවල ව්‍යාප්තිය සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොමැති නමුත් 2015 වර්ෂයට සාපේක්ෂව වර්තමානය වන විට එහි ව්‍යාප්තිය වැඩි බව නිරීක්ෂණය විය. ඒ අනුව පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීම සඳහා පත් කරන ලද බලය ලත් නිලධරයන්ගෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | වාරි පද්ධතියට අවහිර ආක්‍රමණශීලී ශාක ඉවත් කළ යුතුය. | එකඟ වෙමි. |
| (ඇ) | වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතේ දිවයින පුරා පිහිටි මහා වාරි කලාපවල සැල්වීනියා හා ජපන් ජබර සඳහා පැලැටි සංරක්ෂණ සේවය මගින් ජෛව පාලන කෘමීන් හඳුන්වා දෙනු ලැබුවද ඉන් ජපන් ජබර ශාකය සඳහා එම ක්‍රමවේදය සාර්ථකව ක්‍රියාත්මක නොවන බව එම ආයතනය විසින් ප්‍රකාශ කර තිබුණි. ජපන් ජබර ව්‍යාප්තිය මැඩලීම සඳහා වසර 30 කට ආසන්න කාලයකට පෙර හඳුන්වා දෙන ලද කෘමියා සාර්ථක නොවන බවත් ඒ වෙනුවට පර්යේෂණ මගින් හෝ වෙන් ක්‍රමවේද මගින් එම ජපන් ජබර ව්‍යාප්තිය මැඩලීම සඳහා ආර්ථිකභාවයකින් යුතු සාර්ථක ක්‍රමවේදයක් මේවන විටත් අදාළ වගකිවයුතු ආයතන විසින් ඉදිරිපත් කිරීමට අපෙහොසත් වී තිබූ බව නිරීක්ෂණය විය. | ආක්‍රමණශීලී ජලජ ශාක වාරි පද්ධතියෙන් ඉවත් කළ යුතු වීම | එකඟ වෙමි. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ තනතුරු 07 ක් සඳහා අනුමත නිලධාරීන් හා සේවකයින් සංඛ්‍යාව 19 ක් වුවද 2019 දෙසැම්බර් 31 දිනට අනුයුක්ත සේවක සංඛ්‍යාව 13 ක් වී තිබුණි. ඒ අනුව පුරප්පාඩු සේවක සංඛ්‍යාව 06 ක් විය. | අභ්‍යන්තර විගණන අංශයේ කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම සඳහා පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වීම. | එකඟ වෙමි. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තදුචිත කම්කරුවන් ලෙස සේවය කරන ලද සේවකයින් අංක 25/2014 හා 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ස්ථිර සේවයේ පිහිටුවා තිබුණි. 2020 පෙබරවාරි 01 දින වන විට එම සේවකයින් අතුරින් 261 දෙනෙකු සක්‍රීය ස්ථිර සේවා කාලය වර්ෂ 10 නොඉක්මවා නොතිබියදී වයස අවුරුදු 60 සම්පූර්ණ වී විශ්‍රාමයාමට නියමිතව තිබුණි. | විශ්‍රාම වැටුප් ආඥාපනත අනුව සුදුසුකම් ලැබූ සේවකයින්ට විශ්‍රාම වැටුප ප්‍රදානය කිරීමට කටයුතු කළ යුතු අතර විශ්‍රාම වැටුප් හිමිකම් සඳහා සුදුසුකම් නොලබන රජයේ සේවයේ නියුතු සේවකයින් සම්බන්ධයෙන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | එකඟ වෙමි. |